# යුක්තිය පසිඳාලන්නට උර දෙන අපරාධ සහායකයා: දෙපැත්ත කැපෙන අවිය - කටුනේරිය කතා වස්තුව

ජනාධිපති නීතිඥ සරත් ජයමාන්න



### කටුනේරිය කතා වස්තුව

සුනිල්, ඇමතිවරයෙකුගේ රියදුරෙකි. ඔහු පැදවූයේ පැජරෝ ජීප් රථයකි. ඇමතිවරයාගේ බිරිඳ එම දිනයේ සවස 4.30 ට පමණ වාහනයට ගොඩ වී සුනිල්ට දැන්වූයේ ඇය කියන පරිද්දට ජීප් රථය ධාවනය කළ යුතු බවයි. අතරමඟ දී ඇයගේ මඟ පෙන්වීම මත ඇයට අයත් කොහු මෝලේ කළමනාකාරවරයා ද හමුදාවේ සේවය කළ ආරක්ෂක නිලධාරියෙකු ද වෙනත් තරුණයෙකු ද වාහනයට නංවා ගත්තේය. සැතපුම් ගණනක් ධාවනය කළ පසු ඇය, ඇයගේ සහෝදරයාගේ නිවස අසළ දී බැස යන ලදී.

ඉන් අනතුරුව, සුනිල් වාහනය පැදවූයේ මෝලේ කළමනාකරු දුන් උපදෙස් අනුවය. තවත් සැතපුම් ගණනාවක් ගිය පසු අතුරු පාරකට ගොස් ජීප් රථය පාර අයිනේ නතර කලේ කළමනාකාරවරයාගේ කීමටය. ඉදිරිපස අසුනේ සිටි කළමනාකාරවරයා වාහනයෙන් බැස රියදුරු අසුනේ සිටි සුනිල්ට බෝම්බයක් වැනි යමක් පෙන්වා තර්ජනය කලේ පාරට යටින් තිබෙන නිවසට ගොස් එහි සිටින තෙරේසා නැමැත්තිය මහ පාර වෙතට කැඳවාගෙන එන ලෙසටය. තෙරේසා යනු ඇමතිවරයාගේ අනියම් පෙම්වතියයි. ඇමතිවරයා බොහෝ

අවස්ථා වල දී තෙරේසා සමඟ ගමන් බිමන් ගියේ සුනිල් පැදවූ වාහනයෙනි. ඒ නිසා සුනිල් තෙරේසාව හොඳාකාරව දනී. කළමනාකාරවරයා පැවසූයේ ඇමතිවරයා ජීප් රථයේ සිටින බව පවසා තෙරේසා හට ජීප් රථයට පැමිණෙන ලෙසට දන්වන ලෙසටය. මෙයින් බියට පත් වූ සුනිල් අකමැත්තෙන් තෙරේසා ඒ වන විට ලැගුම් ගෙන සිටි නිවසට සෙමෙන් සෙමෙන් ගමන් කලේ ය. නිවස ඉදිරියේ ගේට්ටුවක් විය. ගේට්ටුව ළඟ සිට සුනිල් හඬ නඟන විට නිවසේ දොරෙන් එළියට ඔලුව දමා විපරම් කලේ තෙරේසා නොව, තෙරේසාගේ සේවිකාව වන ටෙක්ලාය.

ටෙක්ලා නිවසට ගොස් තෙරේසාට අමුත්තාගේ පැමිණීම දැන්වූ විට තෙරේසා නිවස ඉදිරියට පැමිණියාය. සුනිල් තමන්ට ලැබුනු උපදෙස් පරිදි ඇමතිවරයා පාරේ නවතා තිබෙන ජීප් රථයේ සිටින බව තෙරේසාට දැන්වුවාය. ඇය සිටියේ රාත්‍රියට අඳින ඇඳුම පිටින් ය. එසේ වුව ද, ඈ කඩිමුඩියේ ම පාර දෙසට ගමන් කළා ය. ඈ පසුපස ඇයගේ සේවිකාව ද ගමන් කළා ය. සුනිල් ද වාහනයට පැමිණ තම අසුනට නැග්ගේ ය. තෙරේසා සහ ටෙක්ලට වාහනය අසළ පැමිණි විගස ඒ වන විටත් වාහනයෙන් එළියට බැස සැඟවී සිටි කළමනාකාරවරයා, ආරක්ෂකවරයා සහ තරුණයා එකතුව තෙරේසා සහ ටෙක්ලාව වාහනයේ පිටුපස අසුනට ඇද දමා ගන්නා ලදී. තෙරේසාට සහ ටෙක්ලාට පිටුපස ආසනයේ දෙපසින් සිටියේ කළමනාකරු සහ ආරක්ෂක නිලධාරියාය. වාහනයේ ඉදිරිපස වම් අසුනේ සිටියේ තරුණයාය. ඔවුන් සියලු දෙනාම වාහනයට නැගගත් පසු තරුණයා සුනිල්ට උපදෙස් දුන්නේ වාහනයේ වීදුරු ඉහළට ඔසවා සම්පූර්ණයෙන්ම වසා දමන ලෙසය. එසේ ම ඔහු වාහනයේ කැසට් යන්ත්‍රයේ හඩ ද වැඩි කලේය. තරුණයාගේ උපදෙස් පිට සුනිල් වාහනය අධික වේගයෙන් ධාවනය කරවන ලදී. වාහනය පදවන විට පිටුපස අසුන දෙසින් කාන්තාවන් දෙදෙනාගේ මොරදෙන හා දඟලන හඬක් සුනිල්ට ඇසෙන්නට විය. ටිකකට පසු එම හඬ හා දැඟලිලි නතර විය. සැතපුම් ගණනාවක් ධාවනය කල පසු ඔහුට අණ ලැබුනේ වාහනය නතර කරන ලෙසටය. ටික වේලාවකට පසු සියලු දෙනාම වාහනයේ නොසිටින බව සුනිල්ට තේරුනේ ඔහු තවමත් වාහනය තුළ රියදුරු අසුනේ රැඳී සිටි නිසාය. විනාඩි කිහිපයකින් වාහනයේ ඇති දකුණු පස පැති කණ්නාඩියෙන් සුනිල් දුටුවේ ගින්දරක් වාහනය පිටුපසින් පොලවේ දැල්වෙන බවය.

විනාඩි කිහිපයකින් කළමනාකාරවරයා, ආරක්ෂකවරයා සහ තරුණයා පැමිණ වාහනයට ගොඩ වුව ද, කාන්තාවන් දෙදෙනා වාහනයට ගොඩ වූයේ නැත. ඉන් පසු වාහනය අධික වේගයකින් සුනිල් පැදවූයේ අතිශයෙන් බියට පත්වය. බිය නිසාම පාලනය කර ගත නොහැකිව වාහනය පාරෙන් එළියට පැන මාර ගසක හැපී නතර විය. වාහනයේ ඉදිරි ලාම්පු කිහිපයක් කුඩු වී එහි කැබලි මාර ගස අසළ වැටුණි. මඩ ආවරණ තැලීමට ලක් විය. අසල්වාසීන් පැමිණ උදව් කිරීම නිසා වාහනය නැවත මහ මඟට දමා ගන්නට හැකි විය. ඉන් අනතුරුව, සුනිල් වාහනය පැදවූයේ ඇමතිවරයාගේ බිරිඳ සවස 4.30 ට පමණ නතර වූ ඇයගේ සහෝදරයාගේ නිවසටය. අනෙක් තුන් දෙනා ද එම නිවස තුළට ගිය ද, සුනිල් නිවස තුළට ගියේ නැත. ටික වේලාවකින් ඇමතිවරයාගේ බිරිඳ වාහනයට නැග ඉදිරි අසුනට නගින් ලදී. අනිත් තුන්දෙනා පිටුපසින් නගින ලදී. නැවත ඔවුන් ඇමතිවරයාගේ නිවසට යන ගමනේ දී පරිමි පුද්ගලයන් තිදෙනා ඔවුන්ගෙ නිවස් අසළ බස්සවන ලදි. ජීප් රථය එදා රාත්‍රියේම ඇමති බිරිඳගේ කීම පරිදි ඇයගේ සහෝදරයාගේ නිවසේ ගාල් කරන්නට සුනිල් පියවර ගත්තේ ය. වාහනය අනතුරට පත්වූයේ තම සහෝදරයාගේ අතින් බවට ඇමතිවරයාට දන්වන බවට ඇමති බිරිඳ සුනිල්ව සැනසුවාය.

**හෙළිදරව්ව**

ටික දිනකට පසු සුනිල් මේ සිදු වූ සියල්ල ඇමතිවරයාට පවසන ලදි. ඇමතිවරයාගේ උපදෙස් මත සුනිල් පොලිසියට ගොස් සිදු වූ සියල්ල දක්වා පැමිණිල්ලක් කරන ලදි. පොලිසිය සුනිල්ව අත්අඩංගුවට ගන්නා ලදි.

මෙම නඩුවේ අපරාධයට සම්බන්ධ වූ පුද්ගලයන් හැරෙන්නට වෙනත් කිසිදු ඇස දුටු සාක්ෂිකරුවෙකු නොමැත. කාන්තාවන් දෙදෙනා දැවූ ස්ථානයේ තිබී පසුව ඇටසැකිළි සොයා ගන්නා ලදි. එබැවින්, මෙය සැබෑ ලෙසම මිනී මැරීමකි. එහි වරද පවරන්නේ කා හට ද? වරද කා හට පැවරුවත් එය සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කරන්නට සාක්ෂිකරුවන් කරන්නේ කවුරුන්ද, විත්තිකරුවන් කරන්නේ කවුරුන්ද යන දෙගිඩියාව පොලිසියට උද්ගත විය.

නීතිපති උපදෙස් ලැබීමෙන් පසුව පොලිසිය තීරණය කලේ අමාත්‍යවරයාගේ බිරිඳ අනිකුත් හතරදෙනා සමඟ මිනී මැරීමට කුමන්ත්‍රණය කල චෝදනාව සම්බන්ධයෙන් අත්අඩංගුවට ගන්නා ලදි. කළමනාකරවරයා 02 වන විත්තිකරු ලෙස ද, ආරක්ෂක නිලධාරියා 03 වන විත්තිකරු ලෙස ද, තරුණයා 04 වන විත්තිකරු ලෙස ද අත්අඩංගුවට ගන්නා ලදි.

සුනිල්ට සිදු වූයේ කුමක් ද? ඔහු පසුව පැමිණිල්ලේ රජයේ සාක්ෂිකරුවකු බවට පත් විය. මූලික පරීක්ෂණය අවසන් වීමෙන් පසු නඩුව හලාවත මහාධිකරණයට තබන ලදි. පසුව කොළඹ මහාධිකරණයේ දී මෙම නඩුව විභාග වූයේ ජූරි සභාවක් ඉදිරියේ දී ය.

## අපරාධ සහායකයෙක්

සුනිල්ව රජයේ සාක්ෂිකරුවෙකු ලෙස නම් කිරීම කෙතරම් දුරට සාධාරණ ද? ඔහු සැබවින්ම අපරාධයට සම්බන්ධ වූයේ ද නැද්ද යන කුතුහලය ඇත. සුනිල් ද විත්තිකරුවෙකු කලේ නම්, පැමිණිල්ලට අනෙක් විත්තිකරුවන් හතර දෙනාට එරෙහිව ඇති නඩුව ඔප්පු කරන්නට සාක්ෂි නැත. විත්තිකරුවන් පොලිසියට කරන ලද ප්‍රකාශ අධිකරණය ඉදිරියේ සාක්ෂි නොවේ. එබැවින්, පැමිණිල්ලට සිදු වන්නේ සාක්ෂි ආඥා පනතේ අනුකූල වන සාක්ෂි ඉදිරිත් කිරීමට පමණි. සාක්ෂි ආඥා පනතේ 133 වන වගන්තියේ දක්වන්නේ අපරාධ සහායකයෙකුගේ සාක්ෂි නීත්‍යානුකූල සාක්ෂියක් බවය. එසේ වුව ද, සාක්ෂි ආඥා පනතේ 114 හි දක්වන්නේ තහවුරු කිරීමකින් තොරව අපරාධ සහායකයෙකුගේ සාක්ෂියේ විශ්වාසනීයත්වය මත රඳා පවත්වා කටයුතු කිරීම අනතුරුදායක බව ය. එය බිඳ හෙළිය හැකි පූර්ව නිගමනයකි.

සුනිල් සැබවින්ම අපරාධ සහායකයෙක් ද? අපරාධ සහායකයෙක් යනු අපරාධයකට කෙලින්ම හෝ ව්‍යංගයෙන් දැනුවත්ව සහභාගී වූ පුද්ගලයෙකුට දෙන නමකි. ඒ අනුව, මෙම අපරාධයට සම්බන්ධ වූ විත්තිකරුවන් හතර දෙනාට අමතරව සුනිල් ද අපරාධයට සම්බන්ධ යැයි කෙනෙකුට තර්ක කල හැකිය. ඒ නයින් බලන කල්හි සුනිල් ද අපරාධ සහායකයෙක් ලෙස සැලකිය හැකි වනු ඇත.

සාක්ෂි ආඥා පනතේ 114 වගන්තියේ සඳහන් පරිදි තහවුරු කිරීමකින් තොරව අපරාධ සහායකයෙකුගේ සාක්ෂි මත රඳා පැවතීම අනතුරුදායක බැවින්, ඔහු අපරාධ සහායකයෙකු නම් ඔහුගේ සාක්ෂිය ස්වාධීන සාක්ෂි වලින් තහවුරු කළ යුතු ය.

ඔහු අපරාධ සහායකයෙකු ලෙස සලකා පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙස නම් කළ ද, සාක්ෂි විභාග වන අවස්ථාවේ දී ඔහු 'ආපස්සට යන්නට වෙර දැරුවහොත් අනෙකුත් විත්තිකරුවන් ද නිදොස් වී ගෙදර යා හැක' එසේ වුවහොත්, සුනිල් පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු ලෙස නම් කිරීම නිෂ්ඵල කාර්යයක් වනු ඇත. මෙවන් තත්ත්වයන් උද්ගත විය හැකි බව අපරාධ කාර්ය පටිපාටික නීතිය සම්පාදනය කල විද්වතුන් සහ විශාරදයන් ඈත අතීතයේ දී අනුමාන පල කල හ. ඒ අනුව, අපරාධ නඩු විමර්ශන සහ විභාග පටිපාටිය නියාමනය කරනු ලබන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත තුළ මෙම ප්‍රශ්නයට ප්‍රායෝගිකව පිළිතුරක් දෙන්නට උත්සාහ දරා ඇත. එම සංකල්පය හඳුන්වන්නේ 'අපරාධ සහායකයෙකුට සමාව දීම' යනුවෙනි. මෙම නීතිමය සංකල්පය ශ්‍රී ලංකාවේ භාවිතා කරන්නේ මූලික පරීක්ෂණයක් (Non Summary Inquires) පැවැත්විය හැකි වරදවල් සම්බන්ධයෙන් පමණි. එනම්, මිනී මැරීම, ස්ත්‍රී දූෂණය කරීම වැනි නඩු සම්බන්ධයෙනි. පීරිස් එරෙහිව ඩූල් 49 නව නීති වාර්තා 142 නඩුවේ දක්වන ලද්දේ යමෙකු අපරාධ සහායකයෙකු ලෙස අර්ථ නිරූපනය කිරීම සඳහා යොදා ගනු ලබන පරීක්ෂාව වන්නේ, එම පුද්ගලයා අපරාධයට සම්බන්ධ අනෙක් පුද්ගලයන් සමඟ එම අපරාධය සම්බන්ධයෙන් එකම අධිචෝදනා පත්‍රයක විත්තිකරුවන් ලෙස නම් කල හැකි ද යන්නයි.

එසේ ම, අපරාධය සිදු කිරීම සඳහා තමා සම්බන්ධ වූ බවට විමර්ශන අවදියේ පාපොච්චාරණයක් කර තිබිය යුතු ය. එනිසා එම අපරාධය සඳහා ඔහුගේ කවර හෝ ආකාරයක දායකත්වයක් ඇති බවට නීතිපති සෑහීමට පත් විය යුතු ය. මීට අදාළ සිද්ධිමය හා නෛතික කරුණු මොනිකා ප්‍රනාන්දු එරෙහිව නීතිපති CA 3-6/2005, 17/2/206 අභියාචනාධිකරණ තීන්දුවේ දක්වා ඇත.

## අපරාධ සහායකයෙකුට සමාව දීම

මීට අදාළ නීතිමය ප්‍රතිපාදන දක්වා ඇත්තේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 256(1) වන

වගන්තියේය. එයින් දැක්වෙන්නේ මෙසේ ය.

'මහාධිකරණය විසින්ම පමණක් නඩු විභාග කල යුතු යම් වරදක් සම්බන්ධයෙන් වන විට, ඒ වරද පිළිබඳව පරීක්ෂණ පවත්වන මහේස්ත්‍රාත්වරයා විසින්, ඒ පරීක්ෂණයට භාජනය වී ඇති වරදට කෙලින්ම හෝ අන් අයුරකින් හෝ සම්බන්ධ වූයේ යැයි නැතහොත් හවුල් වූයේ යැයි විශ්වාස කරනු ලබන යම් තැනැත්තෙකුගේ සාක්ෂි ලබා ගැනීමේ අරමුණ ඇතිව, ඒ තැනැත්තාට සමාව දීම සඳහා නීතිපතිවරයාගේ බලය ලබා ගැනීමෙන් පසුව ද නැතහොත් නීතිපතිවරයා විසින්ම ද ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තා දන්නා සියලු අවස්ථානුගත කරුණු ඒ තැනැත්තා විසින් සම්පූර්ණයෙන් හා සත්‍ය ලෙස හෙළිදරව් කල යුතු ය යන කොන්දේසිය මත, ඒ තැනැත්තාට සහ ඒ වරද කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වරදකරු වශයෙන් හෝ අනුබල දුන් තැනැත්තෙකු වශයෙන් හෝ ඊට සම්බන්ධ වූ වෙනත් සෑම තැනැත්තෙකුටම සමාව දෙනු ලැබිය හැකි ය.'

මෙම වගන්තියට අනුව අපරාධයට කවරාකාරයකින් සම්බන්ධ වූ පුද්ගලයෙකු හට වුව ද, සමාවක් දීමේ බලය නීතිපතිතුමාට ඇත. ඒ අනුව, අපරාධයට සම්බන්ධ ප්‍රධාන සැකකරුවෙකුට හෝ ඔහුට ආධාර අනුබල දීමේ පුද්ගලයෙකුට පවා සමාවක් දීමේ බලය නීතිය මඟින් නීතිපතිතුමාට ලබා දී ඇත. කෙසේ වුව ද බොහෝ අවස්ථාවලදී අපරාධයට සම්බන්ධ ප්‍රධාන තැනැත්තාට නීතිපතිතුමා සමාවක් ලබා දීමට පියවර ගන්නේ නැත. එතුමා භාවිතා කරනු ලබන නිර්නායකය වන්නේ අපරාධයට අඩුවෙන් ම සම්බන්ධ පුද්ගලයා හට සමාවක් ලබා දීම සුදුසු ය යන්නයි. ඒ අනුව, පොලිසිය විසින් නීතිපතිතුමාට උධෘත ගොනු එවූ පසුව නීතිපතිතුමා මුලින්ම සිදු කරනු ලබන්නේ මේ ආකාරයෙන් සමාවක් ලැබීම සඳහා එම සැකකරු කැමැත්ත පල කරන්නේ ද යන්න සොයා බැලීමයි. සමහර විටෙක මූලික පරීක්ෂණ නඩු වාර්තාව ද ගෙන්වාගනු ලබයි. එසේ ඔහු කැමැත්ත පල කරනු ලබන්නේ නම්, නීතිපතිතුමා උපදෙස් දෙන්නේ සැකකරු ස්වේච්ඡාවෙන් ප්‍රකාශක් දීමට කැමැත්තේ නම්, අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්තුමා දැනුවත් කොට මහේස්ත්‍රාත්තුමාගේ නියමය පරිදි ඉදිරි කටයුතු සිදු කරන ලෙසටය. යම් හෙයකින් මහේස්ත්‍රාත්තුමා එම සැකකරුගේ ප්‍රකාශයෙක් සටහන් කරනු ලැබුවහොත්, එම ප්‍රකාශයේ පිටපතක් නීතිපතිවරයාට යොමු කරනු ලබයි. ඉන් පසු එම සැකකරුට සැබවින්ම අපරාධ සහායකයෙකු ලෙස සමාවක් ලබා දීම සුදුසු ද යන්න නීතිපති තීරණය කරනු ඇත. යුක්තිය පසිඳලීම උදෙසා නීතිපතිවරයා බලනු ලබන නිර්නායක මෙසේ ය.

(අ) මෙම සැකකරු සිද්ධියට කවර ආකාරයකින් හෝ සම්බන්ධද යන්නත් එසේත් නොමැති නම් ඔහු හුදු සාක්ෂිකරුවෙක් පමණක් ද යන්නත්,

(ආ) ඔහු විසින් කරනු ලබන ප්‍රකාශය අනුව අනෙක් සැකකරුවන්ට එරෙහිව ප්‍රමාණවත් අන්දමින් සාක්ෂි ඉදිරිපත් වන්නේ ද යන්න

(ඇ) මෙම සැකකරු අපරාධයට සම්බන්ධ ප්‍රධාන පුද්ගලයා ද යන වග

(ඈ) මෙම පුද්ගලයාගේ සාක්ෂිය වෙනත් සාක්ෂි වලින් තහවුරු කිරීමේ හැකියාවක් පවතී ද යන්න

(ඉ) නඩු විභාගයේ දී සාක්ෂි ඉදිරිපත් කිරීමේ දී එම සැකකරු තම ස්ථාවරය වෙනස් කිරීමේ අවදානමක් ඇත් ද යන්න

### මහේස්ත්‍රාත්තුමාගේ භූමිකාව

මෙම කරුණු සියල්ල සලකා බලා නීතිපතිතුමා යම් පුද්ගලයෙකුට සමාව දීම සඳහා තීරණය කරනු ලැබුවහොත්, ඊට අදාළ ගිවිසුමක් පිළියෙල කරනු ලැබේ. එහි තේරුම නම් අපරාධ සහායකයෙකුට සමාව දීමට අදාළ කොන්දේසි ඇතුළත් පත්‍රිකාව සකස් කිරීමය. තවත් වැදගත් කාරණයක් වන්නේ අපරාධයට සෘජු හෝ ව්‍යාංගව සම්බන්ධ නොවූ පුද්ගලයෙකු හට සමාව දීමේ බලයක් නීතිපතිතුමා හට නොමැති වීමයි. අපරාධ නඩු විධාන සංග්‍රහයේ 259 වන වගන්තිය ප්‍රකාරව එහි අඩංගු වන කොන්දේසියක් වන්නේ යම් හෙයකින් මහේස්ත්‍රාත්තුමාට ඒ වන විටත් සැකකරු ලබා දී ඇති ප්‍රකාශයට පටහැනිව නඩු විභාගයේ දී සාක්ෂි දෙනු ලැබුවහොත්, මෙම සැකකරුට එරෙහිව පසු අවස්ථාවක දී අපරාධමය නඩුවක් පවරන බවය. එසේ පවරනු ලබන අපරාධ නඩුවේ චෝදනාව වන්නේ, ඔහු විසින් අනෙක් සැකකරුවන් ද සමග එකතුව

සිදු කරනු ලැබූ ප්‍රධාන අපරාධයයි. එනම් මිනී මැරීමට හෝ ස්ත්‍රී දූෂණ චෝදනාවයි. එවන් නඩු විභාගයක දී සැකකරු විසින් මහේස්ත්‍රාත්තුමාට දෙන ලද ප්‍රකාශය ඔහුට එරෙහිව යොදවන සාක්ෂියක් බවට ද කොන්දේසියක් ඇතුළත් වේ. මෙසේ පිළියෙල කරනු ලබන පත්‍රිකා ඉන් අනතුරුව නීතිපතිතුමා මහේස්ත්‍රාත්තුමාට යවනු ලබන අතර, එතුමා විසින් සැකකරු ගෙන්වා එම පත්‍රිකාවට අත්සන් කිරීමට පෙර එහි ඇති ආදීනව සැකකරුට කියා දිය යුතු වේ. සැකකරු එසේ අවබෝධ කරගෙන ස්වේච්ඡාවෙන් අත්සන් කල පසු මහේස්ත්‍රාත්තුමා ද එම ලේඛනවල අත්සන් කල යුතු ය.

අපරාධ සහායකයාට සාක්ෂි දීම සඳහා 127 වගන්තිය යටතේ මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශයක් සටහන් කිරීම අත්‍යවශය වන්නේ නැත. සැකකරු පොලිසියට දෙනු ලබන ප්‍රකාශයක් මත වුව ද, සමාව දීමේ බලයක් නීතිපතිතුමාට ඇත. නමුත්, බලහත්කාරයෙන් ප්‍රකාශයක් පොලිසියට සටහන් කර ගත්තේයැයි යන දෝෂාරෝපණය මතු කළ හැකි බැවින්, වඩාත්ම ප්‍රවේශම් සහගත සහ සාධාරණ ක්‍රමවේදය වන්නේ, මහේස්ත්‍රාත්තුමා විසින් ප්‍රකාශයක් සටහන් කර ගැනීමය. එම ප්‍රකාශය සැකකරුට තේරුම් කර දුන් බවට මහේස්ත්‍රාත්තුමා සහතික කළ යුතු අතර, ඒ සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 277 වගන්තියේ දක්වා ඇති න්‍යායයන් අනුග මනය කල යුතුය. අනතුරුව, අත්සන් කරනු ලැබූ එම ලේඛන සියල්ල මහේස්ත්‍රාත්තුමා මඟින් නීතිපතිතුමාට එවනු ලැබිය යුතුය.

අධි චෝදනා පත්‍ර සකස් කිරීමේ දී නීතිපතිතුමා මෙම සැකකරු තවදුරටත් සැකකරුවෙකු ලෙස නම් නොකරන අතර, පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු ලෙස නම් කරනු ලැබේ. ඔහුගේ සාක්ෂිය නඩු විභාගයක දී නීතිපතිතුමා වෙනුවෙන් රජයේ අධිනීතිඥවරයා විසින් මෙහෙයවීමෙන් පසු එම සාක්ෂිය තහවුරු කරන වෙනත් සෘජු හෝ පරිවේශණීය සාක්ෂි ඉදිරිපත් කිරීමට නීතිපතිතුමා වග බලා ගත යුතු ය. කොන්දේසි සහිතව දුන් සමාවට අදාළ පත්‍රිකා නඩු විභාග යේ දී ලකුණු කොට ප්‍රදර්ශන භාණ්ඩයක් ලෙස ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. කෙසේ වුව ද, එලෙස කොන්දේසි සහිත සමාවක් නීතිපතිතුමා විසින් ලබා දී ඇති බව රෙජිස්ට්‍රාර්වරයාගේ මාර්ග යෙන් විධිමත් ලෙස අධිකරණයේ දී සාක්ෂියක් මෙහෙයවිය යුතු ය. එසේ ම, නීතිපතිතුමා විසින් යම් සාක්ෂිකරුවෙකුට සමාවක් ලබා දුනහොත්, ඔහුගේ සාක්ෂිය නඩු විභාගය මෙහෙයවීමට අනිවාර්ය බවට යම් කිසි කෙනෙකුට තර්කයක් ගොඩ නැගිය හැකි වනු ඇත.

## අපරාධ සහායකයාගේ සාක්ෂියේ විශ්වාසවන්තභාවය

අපරාධ සහායකයා පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දීමට කැමැත්ත පල කරන්නේ, අපරාධ වගකීමෙන් ගැලවීමේ අපේක්ෂාවෙන් බවට සැකයක් නැත. එසේ ම, කොන්දේසි දමා නීතිපතිතුමා ඔහුට සමාවක් දුන් බැවින්, ඔහු මහේස්ත්‍රාත්තුමාට ලබා දුන් ප්‍රකාශය පරිදි නඩු විභාගයේ සාක්ෂි දීමට බැඳී ද ඇත. මේ තත්ත්වය යටතේ එම අපරාධ සහායකයාට සාක්ෂි වෙනස් කිරීමට ඇති ඉඩකඩ ඉතා සීමිතය. ඒ අනුව, නීතිය අපේක්ෂා කරන්නේ ඔහුගේ සාක්ෂිය වෙනත් ස්වාධීන සාක්ෂි වලින් තහවුරු කල යුතු බවට ය.

මේ කරුණු සියල්ලම සළකා බලා ජූරි සභාවක් ඉදිරියේ පැවති ඉහත සඳහන් කටුනේරිය ද්විත්ව ඝාතන නඩුවේ වාහනයේ රියදුරු ලෙස කටයුතු කල සුනිල්ගේ සාක්ෂිය මහාධිකරණය ඉදිරියේ පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලදි. එහි දී පහත සඳහන් තහවුරු කිරීමේ සාක්ෂි ඉදිරිපත් කරන ලද්දේ අපරාධ සහායකයෙක් වන සුනිල්ගේ සාක්ෂිය තහවුරු කිරීම සඳහා ය.

i. අපරාධයට පැය කිහිපයකට පෙර ජීප් රථය ඉන්ධන ලබා ගැනීමට ඉන්ධන පිරවුම්හලකට ගිය අවස්ථාවේ දී එම වාහනය තුළ සුනිල්ට අමතරව 02, 03 වන සහ 04 වන විත්තිකරුවන් ද සිටි බවට වූ ඉන්ධනහලේ ඉන්ධන පොම්පකරුගේ සාක්ෂිය.

ii. අපරාධයට දිනකට පසු 03 වන විත්තිකරු විසින් ඔහුගේ මිතුරෙකුට කාන්තා මාලයක් භාර දී තිබූ අතර, 03 වන විත්තිකරුගේ නිවසේ තිබී කරාබු ජෝඩුවක් පොලිසියට සොයා ගත හැකි විය. මෙම කරාබු යුවල තෙරේසාට අයිති බවට ඇයගේ නෑනන්ඩියගේ සාක්ෂිය.

iii. අපරාධය සිදු වූ දින තෙරේසා සහ ටෙක්ලා නැවතී සිටියේ තෙරේසාගේ නෑනන්ඩියෙකුගේ ගෙදරය. සුනිල් එම නිවසට පැමිණ තෙරේසා සමග කතා කරන බව මෙම නෑනන්ඩිය දුටුවාය. ඒ අනුව, සුනිල් අවසන් වරට

තෙරේසා සමඟ කතා කිරීමත් ඉන් අනතුරුව තෙරේසා සහ මෙහෙකාරිය පාර පැත්තට යන බවට වූ නැනන්ඩියගේ සාක්ෂිය. පාරට යන්නට මත්තෙන් තෙරේසා තම නැනන්ඩියට පැවසූවේ ඇමතිවරයා පැමිණ ඇති බැවින්, කතා කර එන්නට යනවා කියාය.

iv. අපරාධයෙන් පසු වාහනය පලා යන විට මාර ගසේ වැදීම නිසා එම ස්ථානයේ තිබී විදුලි පහන් වල කැබලි සහ මාර්ග සංඥා පහන්වල කැබලි හමු වීම. එම කැබලි මෙම වාහනයට අයත් බවට වූ රස පරීක්ෂකවරයාගේ මතය.

මෙම නඩුවේ දී පැමිණිල්ල තර්ක කලේ සුනිල් මෙම ක්‍රියාවට සම්බන්ධ වූයේ ඔහු වෙත කරන ලද බලහත්කාරකමක් නිසා මිස ස්වේච්ඡාවෙන් නොවන බවයි. ඔහුව අනෙක් විත්තිකරුවන් විසින් පාවිච්චි කරන ලද්දේ හුදු මෙවලමක් ලෙසය. ඒ අනුව, සිල්වා එරෙහිව වික්‍රමසූරිය නඩුවේ දී දියත් කරන ලද සිද්ධාන්තය පරිදි එවන් අපරාධ සහායකයෙක් සාක්ෂි දෙන අවස්ථාවේ දී ඔහුගේ සාක්ෂිය ස්වාධීන සාක්ෂි වලින් තහවුරු කිරීම අවශ්‍ය නොවන බවයි. ඒ කෙසේ වුව ද, පැමිණිල්ල සතුව ස්වාධීන සාක්ෂි ද තිබෙන බවට පැමිණිල්ල ඒත්තු ගන්වන්නට ද සමත් විය.

## අපරාධයෙන් පසුව උදව් කල පුද්ගලයෙක් අපරාධ සහායකයෙක් ද?

කොබෙයිගනේ අවුරුදු කුමාරී ඝාතන නඩුවේ සමරකෝන් එදිරිව රජය 2004 (2) එස් එල් ආර් 209 ප්‍රධාන සාක්ෂිකරු වූයේ චූලසිරි නැමති ග්‍රාමාරක්ෂක භටයාය. ඔහුගේ සාක්ෂියේ හරය වන්නේ, සිද්ධිය වූ දින විත්තිකරුගේ විධානය මත විත්තිකරු විසින් පදවන ලද වෑන් රථයට ඔහු ද නැග්ග බවය. ඊට අමතරව විත්තිකරුගේ නිවසේ සිටි මරණකාරිය වන කොබෙයිගනේ රූමතිය වාහනය ඉදිරිපසට නැග්ගාය. ටික වෙලාවක් ගමන් කිරීමෙන් පසුව කිනගම හන්දියට පැමිණි විට විත්තිකරු පවසා ඇත්තේ, තම මිතුරෙකු මුන ගැසීම සඳහා මරණකාරියට වාහනයෙන් බසින ලෙසය. ඒ අනුව, මරණකාරිය වාහනයෙන් බැස ඒ අසල තිබුනු කෙටි පාරකින් ඉදිරියට ගමන් කරන විට ඒ පිටුපසින් පැමිණි කොබෙයිගනේ පොලිසියේ මූලස්ථාන පොලිස් පරීක්ෂක වන විත්තිකරු තම මැෂින් තුවක්කුවෙන් මරණකාරියට හට වෙඩි තබා ඇත. ඇය ඉන් මැරී වැටිණි. ඉන් අනතුරුව, විත්තිකරු චූලසිරිට නියම කොට ඇත්තේ, වෑන් රථයේ පිටුපස තිබෙන පැට්‍රල් සහිත පැට්‍රල් කෑනය රැගෙන එන ලෙසටය. විත්තිකරු, සාක්ෂිකරුට කීවේ එම පැට්‍රල් මරණකාරියගේ ශරීරයට හලන ලෙසටය. සාක්ෂිකරු එය ප්‍රතික්ෂේප කල විට විත්තිකරු විසින් ම පැට්‍රල් මරණකාරියගේ දේහයට හලන ලදි. විත්තිකරු ගිනි පෙට්ටියක් ගෙන එම දේහයට ගිනි අවුලුවන ලෙසට සාක්ෂිකරුට ප්‍රකාශ කළ ද සාක්ෂිකරු එයට ද අදිමදි කලේ ය. අවසානයේ දී විත්තිකරු තමා විසින් ම මරණකාරියගේ දේහයට ගිනි අවුලුවන ලදී.

මෙම සිද්ධාන්තය රැජන එරෙහිව ආරියවංශ නඩුවේ දී වර්ධනය කොට ඇත. ඉනෝකා සෙව්වන්දි ඝාතන නඩුවේ දී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දීම සඳහා කැඳවූ අපරාධ සහායකයන් දෙදෙනාත් මරණකාරියගේ ඝාතනය සඳහා ප්‍රධාන සැකකරු හට ආධාර කර තිබුනේ නැත. ඔවුන් උදව් කරන ලද්දේ ඝාතනය කරන ලද මරණකාරියගේ දේහය විනාශ කිරීම සඳහා ය. ඇයගේ ඝාතනයට අදාළ මෙම සිද්ධාන්තය අඩංගු වන්නේ ද සේරම් එරෙහිව ශ්‍රී ලංකා ජනරජය දරන නඩු තීන්දුවේ දී ය. එසේ ම, රජීව එරෙහිව පීරිස් අප්පුහාමි යන නඩුවේ දී සඳහන් කරන ලද්දේ ද මිය ගිය තැනැත්තාගේ මෘත දේහයට අදාළ සාක්ෂිය විනාශ කිරීමට ආධාර අනුබල දුන් පුද්ගලයෙකු මිනී මැරීමේ වරද සම්බන්ධයෙන් අපරාධ සහායකයෙක් ලෙස නොසැළකිය යුතුය යන්නයි.

කොබෙයිගනේ නඩුවේ දී පැමිණිල්ල චූලසිරි හට කොන්දේසි සහිත සමාවක් ප්‍රදානය කිරීම සිදු කලේ නැත. චූලසිරි තම සාක්ෂිය වෙනස් නොකරනු ඇතැයි යන විශ්වාසය නීතිපතිතුමාට තිබුනු නිසා විය හැක. එසේ වුව ද, චූලසිරි අපරාධ සහායකයෙක්ය යන තර්කය ගොඩනැ ගීමට විත්තියට කිසිම බාධාවක් නොමැත. මෙයට පිළිතුරු ලෙස පැමිණිල්ල තර්ක කර සිටියේ චූලසිරි විසින් යම් සහායක් විත්තිකරු හට දෙනු ලැබුවා නම් එසේ දෙනු ලැබුවේ මිය ගිය කොබෙයිගනේ රූපසුන්දරියගේ දේහයට ගිනි තබා විනාශ කිරීම සඳහා ය. මෙම නඩුවේ නගා තිබූ චෝදනාව වූයේ මිනී මැරීමේ චෝදනාවයි. පැමිණිල්ල තර්ක කලේ මරණකාරියගේ ඝාතනය සඳහා චූලසිරි කිසිදු ආකාරයක සහායක් නොදැක්වූ නිසා චූලසිරි කිසි සේත්ම අපරාධ සහායකයෙකු ලෙස සැලකිය යුතු නොවන බවටය. එසේ වුව ද,

පැමිණිල්ල තවදුරටත් දක්වා සිටියේ ඔහු අපරාධ සහායකයෙක් ලෙස සැලකුව ද, නොසැලකුව ද, ඔහුගේ සාක්ෂිය ස්වාධීන සාක්ෂි වලින් තහවුරු කිරීම පැමිණිල්ල සිදු කරන ලද බවය. එම තහවුරු කිරීමේ සාක්ෂි නම්

i. අපරාධය වීමට පැයකට පමණ ප්‍රථම විත්තිකරුගේ ඉල්ලීම මත වෑන් රථයේ අයිතිකරු හට වෑන් රථය පොලිස් ස්ථානයට භාර දෙන ලෙසට චූලසිරි වෑන් රථයේ හිමිකරුට දැන්වීම.

ii. අපරාධයෙන් පසු දින දෙකකින් චූලසිරි පොලිස් ස්ථානයේන පලා යාම.

iii. අපරාධය සිදු වූයේ බදාදා දිනයක රාත්‍රී 8.00 ට පමණ වන අතර, අපරාධ ස්ථානයට සැතපුම් කාලක් පමණ ඈතින් සිටි වයෝවෘද්ධ සාක්ෂිකරුවන් දෙදෙනා විසින් එම වේලාවට වාහනය පැමිණීම, එහි ආලෝකය නිවීම, වෙඩි හඬක් ඇසීම, ගින්දරක් මතු වීම, වාහනය නැවත පිටවී යාම වැනි දෑ සම්බන්ධයෙන් දෙන ලද අනුපිළිවෙල චූලසිරිගේ සාක්ෂිය හා අපූර්වට සමපාත වීම.

iv. වාහනයේ තිබී කාන්තාවකගේ කොන්ඩා කට්ටක් වාහනයේ අයිතිකරුට ලැබීම. රාත්‍රී 8.20 ට පමණ වාහනය විත්තිකරු සහ චූලසිරි විසින් නැවත වාහනයේ අයිතිකරු හට භාර දීම.

පැමිණිල්ල විසින් ගොඩ නගන ලද තවත් තර්කයක් වූයේ චූලසිරි හට එම අවස්ථාවේ දී කටයුතු කරන්නට සිදු වූයේ විත්තිකරුගේ බලපෑම යටතේ ය. ඔහු විත්තිකරු අභියස හුදු මෙවලමක් බවට පත් වූ බවය. එසේ මෙවලමක් බවට පත් වූයේ නම්, එවන් පුද්ගලයෙකුගේ සාක්ෂියක් ස්වාධීන සාක්ෂි ලෙස තහවුරු කිරීම අනවශ්‍ය බවය. මෙය කලින් සඳහන් කරන ලද සිල්වා එදිරිව වික්‍රමසූරිය නඩුවේ දී ගොඩ නගන ලද නීතිමය සිද්ධාන්තය පදනම් කරගෙන කරන ලද්දකි.

එක් අපරාධකරුවෙකුගේ සාක්ෂිය තවත් අපරාධකරුවෙකුගේ සාක්ෂියෙන් තහවුරු කල නොහැකි බව රජන එරෙහිව ලියනගේ සහ වෙනත් අය යන නඩු තීන්දුවේ දක්වා ඇත. රීටා ජෝන්ස් නඩුවේ අපරාධ සහායකයන් දෙදෙනෙකුට සමාව ලබා දී තිබුන ද, නඩු විභාග යේ දී පැමිණිල්ල විසින් සාක්ෂි මෙහෙයවන ලද්දේ එක් අපරාධකරුවෙකුගේ සාක්ෂිය පමණි. විත්තිය තර්ක කලේ අනෙක් පුද්ගලයාගේ සාක්ෂිය පැමිණිල්ල විසින් මෙහෙයවීමෙන් වැළකී සිටි නිසා විත්තිකරු හට අගතියක් වූ බවය. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කලේ එම පුද්ගලයාගේ සාක්ෂිය අවශ්‍ය නම්, විත්තියට පවා මෙහෙයවිය හැකිව තිබුනු බැවින්, පැමිණිල්ල එම සාක්ෂි මෙහෙයවීම වැලැක්වීමෙන් විත්තියට අගතියක් සිදු නොවුනු බවයට.

හෝකන්දර ඝාතන නඩුවේ එකම පවුලේ 06 දෙනෙකුගේ ඝාතනය සඳහා අධිකරණය ඉදිරියේ වරදකරුවන් වූ විත්තිකරුවන් තිදෙනා සම්බන්ධ බවට සාක්ෂි ඉදිරිපත් කරන ලද්දේ ඔවුන්ගේම කණ්ඩායමේ සිටි අවුරුදු 19 ක් පමණ වයසැති ජොන්ටි නැමැත්තා විසිනි. නීතිපතිතුමා ජොන්ටි හට ද කොන්දේසි සහිත සමාවක් ලබා දුන්නේ නැත. එසේ වුව ද, ජොන්ටි ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලය ඉදිරියේ දී සාක්ෂි දීමේ දී සාක්ෂිය වෙනසන් කරන්නට උත්සාහ කලේ නැත. කවර තත්ත්වයන් යටතේ වුව ද ජොන්ටි අපරාධ සහායකයෙක් ය යන තර්කය ගොඩ නැගීමට විත්තියට අවකාශයක් නොමැත. සැබවින්ම ඔහු අපරාධ සහායකයෙක් යන තර්කය විත්තිය ගොඩ නගන ලදි. පැමිණිල්ල තර්ක කලේ ඔහු අනෙක් විත්තිකරුවන් අභියස හුදු මෙවලමක් ලෙසට කටයුතු කල බැවින්, තහවුරු කිරීමේ සාක්ෂි සොයා යෑමේ අවශ්‍යතාවයක් නොවන බවය. එනමුදු පැමිණිල්ල විසින් එම ජොන්ටිගේ සාක්ෂිය තහවුරු කිරීම සඳහා වෙනත් පරිවේශනාත්මක සාක්ෂි ද ඉදිරිපත් කරන ලදි. විශේෂයෙන් ම අපරාධය සිදු වූ නිවස තුළ මෘත දේහ තිබුනු ආකාරය සහ ඒ තුවාල සිදු කල ආකාරය සහ සිදු වූ වේලාව සම්බන්ධයෙන් ජොන්ටි දුන් සාක්ෂිය පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වූ අධිකරණ වෛද්‍යවරුන්ගේ සාක්ෂි සහ ස්ථානීය නිරීක්ෂණ සිදු කල විමර්ශකයන්ගේ සාක්ෂි සමඟ අපූරුවට සම්පාත විය.

සතාසිවම් ඝාතන නඩුවේ පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද විලියම් ට නීතිපතිතුමා විසින් කොන්දේසි සහිත සමාවක් ලබා දී තිබුණි. එහි දී ද පැමිණිල්ල තර්ක කරන්නට ඇත්තේ විලියම් අවුරුදු 20 ක වැනි වයසේ පසු වූ ගෙදර මෙහෙකාරකමට සිටිය තැනැත්තෙක් බවත්, තමාගේ හාම්පුතා වූ 01 වන විත්තිකරු විලියම්ගේ උදව් ඉල්ලා සිටින ලද්දේ එම 01 වන විත්තිකරු විසින් තම බිරිඳ වූ මරණකාරියගේ ගෙල සිර කිරීමේ දී ඇය දඟලන බැවින්,

ඇයගේ කකුල් දෙක අල්ලා ගැනීම සඳහා ය. කලින් සඳහන් කල සිද්ධාන්තයම පාවිච්චි කොට විලියම් විත්තිකරු අබියස හුදු මෙවලමක් වූ බවට තර්ක කල හැකි ය. එබැවින්, විලියම්ගේ සාක්ෂිය වෙනත් ස්වාධීන සාක්ෂි වලින් තහවුරු කිරීමේ අවශ්‍යථාවයක් නැතැයි යන්න පැමිණිල්ල තර්ක කල හැකිව තිබුණි. කෙසේ නමුත්, විලියම්ගේ සාක්ෂියේ ඇති විශ්වාසනීයත්වය පිළිබඳව දැඩි ප්‍රශ්න ගණනාවක් එම නඩුවේ දී උද්ගත වූ බැවින්, විත්තිකරු වන සතාසිවම් මහතා එම නඩුවෙන් නිදොස් කරලන්නට සිදු විය.

**අවසානය**

ශතවර්ෂයකටත් අධික කාලයක් මුළු'ල්ලේ මෙම රටේ පමණක් නොව, අනෙකුත් රටවල පාහේ මුල් බැස ගත් සිද්ධාන්තයක් වන අපරාධ සහායකයෙකුගේ සාක්ෂිය නීති පොතෙන් කිසිදු දිනයක ඉවත් වන බවක් පෙනෙන්නට නොමැත. බොහෝ අපරාධ සිදු කරනු ලබන්නේ සැලසුම් සහගතව හොර රහසේ ඇසු දුටු සාක්ෂිකරුවන් නොමැති අවස්ථාවන් සොයා ගැනීමෙන් පසුවය. එබැවින්, අපරාධයට සම්බන්ධ ප්‍රධාන පුද්ගලයන් කොටු කර ගන්නට නම්, එම අපරාධයට සම්බන්ධ තවත් පුද්ගලයෙකු සොයාගෙන ඔහු හට සමාවක් ලබා දීම සිදු කල යුතුම වන්නේ ය. එදා මෙන් නොව අද තාක්ෂණය දියුණු වී ඇති බැවින්, එකී අපරාධ සහායකයන්ගේ සාක්ෂිය තාක්ෂණික මෙවලම් ඔස්සේ ද තහවුරු කල හැකි වනු ඇත. ඒ අනුව, සීසීටීවී කැමරා, ජංගම දුරකථන සහ වෙනත් රූප හා ශබ්ද මාධ්‍ය ඔස්සේ සිදු වූ දෑ සියල්ල නිහඬව වාර්තා කර තබනු ඇත. ඒ අනුව, අපරාධ සහායකයෙකුගේ සාක්ෂි මත විතතිකරුවන් වරදකරු කිරීම සාධාරණීකරණය කිරීමට හැකි වනු අවස්ථා උදා වනු ඇත. කවර සාක්ෂි ප්‍රභේද පැමිණිල්ල සොයා ගත්ත ද, දක්ෂ විත්තියේ නීතීඥ මහතෙකුට සැලසුම් කරනු ලැබුවහොත්, උපක්‍රමශීලීව සහ ශාස්ත්‍රානුකූලව පැමිණිල්ලේ නඩුව පිළිබඳව විශේෂයෙන්ම අපරාධ සහායකයෙකුගේ සාක්ෂිය පිළිබඳව සාධාරණ සැකයක් මතු කිරීමට උත්සාහ කල හැකි ය.

Author can be contacted at email:
sarathjayamanne@gmail.com